RG/MBD/01/චක්‍රලේඛ

චක්‍රලේඛ අංක : 01/2020

2020.01.23

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**මරණ ප්‍රකාශය ( ලියාපදිංචි කිරීම - බී 33) සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2016.09.14 දිනැති 08/2016 චක්‍රලේඛය හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ 02 ඡේදයේ දැක්වෙන බී 33 ආකෘතියේ පිටපත් සම්බන්ධයෙන් 2020.03.01 දින සිට පහත පරිදි ක්‍රියාකරන මෙන් මෙයින් උපදෙස් දෙමි.

| | |
|---|---|
| මුල් හා දෙවන පිටපත් | - මිය ගිය අයගේ ඥාතීන් වෙත නිකුත් කිරීම |
| තුන්වන පිටපත | - රෝහල භාරයේ තබා ගැනීම |

03. මෙලෙස මියගිය අයගේ ඥාතීන් වෙත නිකුත් කරනු ලබන මුල් හා දෙවන පිටපත් දෙකම මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් විසින් භාරගත යුතු අතර, රෙජිස්ට්‍රාර් විසින් මරණ ලියාපදිංචි කිරීමේදී එම දෙවන පිටපතෙහි අදාළ දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, රෙජිස්ට්‍රාර් කොට්ඨාශය, දිනය හා මරණ සහතිකයේ අංකය සටහන් කොට සිය අත්සන තබා ( ඇමුණුම 1 අනුව සැකසූ මුද්‍රාවක් මගින්) මාසික සාරාංශ ලේඛනය සමග අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය වෙත භාරදීම සිදු කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් ජීව සංඛ්‍යාති වාර්තා සමග මෙම දෙවන පිටපත් මාස්පතා ප්‍රධාන කාර්යාලයේ සංඛ්‍යාලේඛන අංශය වෙත එවීමට කටයුතු කළ යුතුවේ.

04. මේ අනුව බී 33 ආකෘතියේ දෙවන පිටපත රෝහල මගින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත සෘජුවම එවීම මින් ඉදිරියට සිදු නොවන අතර ඒවා ජීව සංඛ්‍යාති වාර්තා සමග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය වෙත යොමු කිරීමට සැලැස්වීම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ වගකීම වේ. මෙම ආකෘතියේ තබන මුද්‍රාව පිරවීමේදී සංඛ්‍යාලේඛන අංශය මගින් ලබා දී ඇති කේතයන් (අංක) සඳහන් කිරීම ද කළ යුතු වේ.

05. මෙම උපදෙස් සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමට කටයුතු කළයුතු අතර, මෙම වැඩ සටහන නිසි පරිදි ක්‍රියාත්මක කරවීමට ඔබගේ නිරන්තර අධීක්ෂණයද වැදගත් වන බව වැඩි දුරටත් දන්වමි.

එන්.සී.විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්

එන්. සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

පිටපත්

1.සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු, දැ.ගැ.ස.
2.ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කරු, දැ.ගැ.ස.
3. සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු, දැ.ගැ.ස.
4.නියෝජ්‍ය අධ්‍යක්ෂ, සංඛ්‍යාලේඛන අංශය, රෙජි.ජ.දෙපා - කරු, අ.ක.ස.
5.සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - කරු, දැ.ගැ.ස.